(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **50.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025** මැයි **08** බ්‍රහස්පතින්දා පූ.භා. **9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබුබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු  සංජීව රණසිංහ මහතා

ගරු  ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු  සුනිල් රත්නසිරි මහතා

ගරු  ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු  සුරංග රත්නායක මහතා

ගරු  අසෝක සපුමල් රන්වල මහතා

ගරු  තුරෛරාසා රවිකරන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු  මනෝජ් රාජපක්ෂ මහතා

ගරු  සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු  (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු  දීප්ති වාසලගේ මහත්මිය

ගරු  නයන වාසලතිලක මහතා

ගරු  කංචන වැලිපිටිය මහතා

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  ආර්.ජී. විජේරත්න මහතා

ගරු  නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු  රුවන් විජේවීර මහතා

ගරු  ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු  නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු  චමින්ද විජේසිරි මහතා

ගරු  අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු  ජගත් විතාන මහතා

ගරු  සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු  ෆස්මින් ෂරීෆ් මහතා

ගරු  (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම:** කෑගල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු රත්නායක මුදියන්සේලාගේ සමන්ත රනසිංහ මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සහා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේ ය.

**2. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 අප්‍රේල් මස 22 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**
**Democratic Socialist Republic of Sri Lanka**

**3. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2025 අප්‍රේල් 11 දින 'එකතු කළ අගය මත බදු (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි හා 2025 අප්‍රේල් 30 දින 'අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**II**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

**III**

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දසනායක මහතා විසින් 2025 මාර්තු 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය."

**IV**

"2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධාන පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු වසන්ත සමරසිංහ මහතා

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා

ගරු අබූබකර් අතම්බාවා මහතා"

**V**

"2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධාන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු සුනිල් රත්නසිරි මහතා"

## VI

"2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන පරිදි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු අබූබකර් අතම්බාවා මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා"

## VII

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 හි විධිවිධාන පරිදි සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පහත සඳහන් එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවල සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

1. ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

2. යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

3. අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු අබූබකර් අතම්බාවා මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

4. සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු මුනීර් මුලාෆර් මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු රුවන් මාපලගම මහතා

5. පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

6. විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු  චතුරංග අබේසිංහ මහතා

ගරු  අර්කම් ඉල්යාස් මහතා

ගරු  ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු  තනුර දිසානායක මහතා

ගරු  නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු  (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු  චන්දිම හෙට්ටිආරච්චි මහතා"

**VIII**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධාන පරිදි සහ පාර්ලිමේන්තුව විසින් 2025 මාර්තු 19 දින සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා, පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ ද නාම ලේඛන භාෂාත්‍රයෙන්ම මම සභාගත කරමි:—

1. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

2. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

3. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

4. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

5. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

6. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

7. ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

8. කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

9. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

10. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

11. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

12. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

13. කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

14. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

15. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

16. විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

17. බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

18. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

19. ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

20. පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

21. තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

22. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

23. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව; සහ

24. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු සුනිල් කුමාර ගමගේ මහතා

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රුවන් විජේවීර මහතා

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු මහින්ද ජයසිංහ මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු නිතිඥ හසාරා ලියනගේ මහත්මිය

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු වසන්ත පියතිස්ස මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු මුහම්මද් ෆයිසාල් මහතා

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු වසන්ත පියතිස්ස මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා

ගරු පී. රුවන් සෙනරත් මහතා

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා

කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු අරවින්ද සෙනරත් මහතා

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා

ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා

ගරු මුනීර් මුලාෆර් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා

ගරු එරංග වීරරත්න මහතා

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා

බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ඇන්ටන් ජයකොඩි මහතා

ගරු සුගත් තිලකරත්න මහතා

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු අශෝක ගුණසේන මහතා

ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු චතුරංග අබේසිංහ මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රුවන් විජේවීර මහතා

පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව; සහ

ගරු රත්න ගමගේ මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා

ගරු ගමගෙදර දිසානායක මහතා

ගරු ටී. බී. සරත් මහතා

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

ගරු නාමල් කරුණාරත්න මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු කන්දසාමි ප්‍රභු මහතා”

**4. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIX කොටස;

(ii) 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XLIII කොටස; සහ

(iii) 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XL කොටස, තෙවැනි කාණ්ඩයේ XVII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXIII කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය; සහ

(iv) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

ඉදිරිපත් කර, එම රෙගුලාසි, නියෝගය, නිවේදනය සහ නියමය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ පෝෂණය හා ආහාරවේදය අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ රේගු ආනයන තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 පෙබරවාරි 25 දිනැති අංක 2425/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2025 අංක 3 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2025.03.01 සිට 2025.03.27 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන

ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) බලශක්ති අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර, එම වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය (2025 ජනවාරි 27 දිනැති අංක 2421/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2025 අප්‍රේල් 9 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද) සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**6. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) අතුරුගිරිය, ඔරුවල, ලේක් ටෙරස්, 5 වැනි පටුමග, අංක 723/80 දරන ස්ථානයෙහි පදිංචි බී. එච්. ජී. නයනි රේණුකා මහත්මියගෙන් ලැබුණු 2025.02.20 දිනැති පෙත්සම;

(ii) කඩවත, පහළ බියන්විල, පුෂ්පාරාම මාවත, අංක. 145 දරන ස්ථානයෙහි පදිංචි එල්. පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2025.02.14 දිනැති පෙත්සම;

(iii) තඹුත්තේගම, රාජාංගනය පාර, අංක 238 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. එස්. විජේතුංග මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම;

(iv) මාතර, වේරදූව, නාවිමන පාර, අංක 31 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත වික්‍රමසේකර මහතාගෙන් ලැබුණු 2025.03.27 දිනැති පෙත්සම;

(v) වත්තල, එඬේරමුල්ල, ශාන්ත ජූඩ් පාර, අංක 45/1 දරන ස්ථානයෙහි පදිංචි රොහාන් අල්විස් කොතලාවල මහතාගෙන් ලැබුණු 2025.02.13 දිනැති පෙත්සම;

(vi) පේරාදෙණිය, උඩ ඊරියගම, අංක 129 දරන ස්ථානයෙහි පදිංචි ශ්‍රියානි හෙට්ටිවත්තගේ මහත්මියගෙන් ලැබුණු 2025.04.01 දිනැති පෙත්සම; සහ

(vii) ත්‍රිකුණාමලය, ධ්‍යානගම, ඉදිරිපිට නිවස, ඩී-4 දරන ස්ථානයෙහි පදිංචි ටී. අප්සරා ජීවාංගනී මහත්මියගෙන් ලැබුණු 2024.11.24 දිනැති පෙත්සම

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මහනුවර, වේවැල්ල පාර, අංක 58/5 බී දරන ස්ථානයෙහි පදිංචි ඒ. එම්. ප්‍රියා දමයන්ති මහත්මියගෙන් ලැබුණු 2024.12.05 දිනැති පෙත්සම;

(ii) පානදුර, වලාන, පොදුජන මාවත, අංක 67 බී දරන ස්ථානයෙහි පදිංචි ඩී. එච්. ගමගේ මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම; සහ

(iii) රාගම, කපු වැව පාර, අංක 648 බි දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. සී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) පිළියන්දල, තුම්බෝවිල, වෙද මාවත, 3 වැනි පටුමග, අංක 202/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජී. සුනීතා පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2025.01.20 දිනැති පෙත්සම; සහ

(ii) පන්නිපිටිය, දෙපානම, අරලිය උයන, අංක 75/49 එෆ් දරන ස්ථානයෙහි පදිංචි කේ. ඩී. නීලිකා අතුකෝරළ මහත්මියගෙන් ලැබුණු 2025.02.08 දිනැති පෙත්සම

ගරු දේවානන්ද සුරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**7. විදේශීය ණය (ඉවත් කිරීමේ):** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1957 අංක 29 දරන විදේශීය ණය පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 මැයි 22 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8. පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන):** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 මැයි 22 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**9. ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන):** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 මැයි 22 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු රවී කරුණානායක මහතා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත අවලංගු කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවැනිවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**11. රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.04.09 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 ජනවාරි 27 දිනැති අංක 2421/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අ.භා. 12.03ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.33ට ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම:** එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 මැයි 09 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.